ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு வர்த்தமானப் பத்திரிகை
The Gazette of the Democratic Socialist Republic of Sri Lanka

අති විශෙෂ அதிவிசேஷமானது EXTRAORDINARY

අංක 823/16 – 1994 ජූනි 16 වැනි බ්‍රහස්පතින්ද – 1994.06.16
823/16 ஆம் இலக்கம் — 1994 ஆம் ஆண்டு யூன் மாதம் 16 ஆம் திகதி வியாழக்கிழமை
No. 823/16 – THURSDAY, JUNE 16, 1994

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.) (அரசாங்கத்தின் அதிகாரத்துடன் பிரசுரிக்கப்பட்டது) (Published by Authority)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### 1980 අංක 26 දරන ආහාර පනත

1980 අංක 26 දරන ආහාර පනතේ 32 වැනි වගන්තිය යටතේ ආහාර උපදේශක කමිටුවේ උපදෙස් ලබා ගැනීමෙන් පසු සෞඛ්‍ය හා වනිතා කටයුතු අමාත්‍යවරිය විසින් සාදන ලද නියෝග.

රේණුකා හේරත් රණවීර,
සෞඛ්‍ය හා වනිතා කටයුතු අමාත්‍ය.

1994 මැයි මස 23 වැනි දින,
කොළඹ දී ය.

මෙම රෙගුලාසි ආහාර (කිරිවල පරිරක්ෂණ ද්‍රව්‍ය) රෙගුලාසි 1994 ලෙස හැඳින්වෙන අතර, 1994 සැප්තැම්බර් මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වේ.

1. කිසිම පුද්ගලයෙකු විසින් කිරිවලට පරිරක්ෂණ ද්‍රව්‍යයක් එකතු කළයුතු නොවේ.

2. කෙසේ වෙතත් 6 වන වගන්තියෙන් සඳහන් වන පරිදි විශේෂ අවස්ථාවල දී කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන සහ/හෝ කර්මාන්තශාලාවල දී ආහාර වර්ගයට අයත් හයිඩ්‍රජන් පෙරොක්සයිඩ් පරිරක්ෂණයක් වශයෙන් කිරිවලට එකතු කළ හැක.

3. කෙසේ වෙතත් කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානවලදී සහ/හෝ කර්මාන්තශාලා වල දී හයිඩ්‍රජන් පෙරොක්සයිඩ් ($H_2O_2$) යෙදෙන අවස්ථාවලදී එම එකතු කරන ස්ථානයේ/කර්මාන්තශාලාවේ වග කිවයුතු පුද්ගලයෙකු විසින් හයිඩ්‍රජන් පෙරොක්සයිඩ් ($H_2O_2$) එකතු කළ වේලාවේ සිට පැය 12 කට නොවැඩි කාලයක් ඇතුළත දී ඒ සම්බන්ධයෙන් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාට හෝ අදාළ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයාට හෝ පළාතේ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයාට හෝ ප්‍රාදේශීය සෞඛ්‍ය නිලධාරියාට හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාට හෝ දැනුම් දී සිටිය යුතුයි.

4. අවසර දී ඇති අවස්ථාවක දී කිසිම පුද්ගලයකු විසින් ඒකකයට 0.01 නොඉක්මවන සුළු හයිඩ්‍රජන් පෙරොක්සයිඩ් ($H_2O_2$) සාන්ද්‍රනයක්, නිෂ්පාදනයේ කුමන අවස්ථාවක දී හෝ එකතු කිරීම හෝ එකතු කිරීමට කටයුතු කිරීම කළයුතු නොවේ.

5. ඉහත සඳහන් විධිවිධානවල කෙලෙස සඳහන් වුව ද, මෙම රෙගුලාසිය යටතේ ඇති අවශ්‍යතාවයන් උල්ලංඝණය නොවන පරිදි, ප්‍රධාන ආහාර බලධාරියා (සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්) විසින් විශේෂිත කිරි නිෂ්පාදකයින්හට හයිඩ්‍රජන් පෙරොක්සයිඩ් ($H_2O_2$) පාවිච්චි කිරීමට අවසර දිය හැක.

6. මෙම රෙගුලාසි යටතේ ගැනෙන විශේෂ අවස්ථා වනාහි —

(අ) ශීතකරණ උපකරණ අක්‍රියවීම ;

(ආ) විදුලිය ඇනහිටීම ;

(ඇ) කිරි ප්‍රවාහනය අඩාලවීම ;

(ඇ) ස්වභාවික ආපද, සිවිල් කෝලාහල, වැඩ වර්ජන, යුද්ධමය ක්‍රියා වැනි සිද්ධි නිසා කිරි ශීතකරණ මධ්‍යස්ථාන ක්‍රියා විරහිත වීම.

7. කෙසේ වෙතත් කිරිවල පරිරක්ෂණ ද්‍රව්‍යයක් වශයෙන් හයිඩ්‍රජන් පෙරොක්සයිඩ් ($H_2O_2$) යොදන අවස්ථාවල දී, පහත සඳහන් කොන්දේසි නදින්ම පිළිපැදිය යුතු වේ :

(අ) පුහුණු අවසරලත් සහ කර්මාන්ත ශාලාවේ වගකිව යුතු නියෝජිතයෙකු හැර කිරි නිෂ්පාදකයින් විසින් එකතු කිරීම නොකළ යුතු බවට ;

(ආ) හයිඩ්‍රජන් පෙරොක්සයිඩ් ($H_2O_2$) පාවිච්චිය පිළිබඳ වාර්තා තබාගත යුතු බවට ;

(ඇ) භාර ගන්නා කර්මාන්ත ශාලාව තුළ දී ඉතිරි හයිඩ්‍රජන් පෙරොක්සයිඩ් ($H_2O_2$) සඳහා කිරි නිතර නිතර පරීක්ෂා කර, වාර්තා තබා ගන්නා බවට ;

(ඇ) අදාල කර්මාන්ත ශාලාවේ, පුහුණු තත්ත්වපාල නිලධාරියෙකු විසින් හයිඩ්‍රජන් පෙරොක්සයිඩ් ($H_2O_2$) භාවිතය ප්‍රවේශම් සහිතව අධීක්ෂණය කරන බවට.

8. කිරිවල පරිරක්ෂණ ද්‍රව්‍යයක් වශයෙන් හයිඩ්‍රජන් පෙරොක්සයිඩ් ($H_2O_2$) පාවිච්චි කිරීමට අවසර දීම සම්බන්ධයෙන් අදාල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි හෝ දිස්ත්‍රික් සෞඛ්‍ය නිලධාරි විසින් කිරි එකතු කරන මධ්‍යස්ථානයට හෝ කර්මාන්ත ශාලාවට දන්වා සිටිය යුතුය.

9. මෙම රෙගුලාසිවලින් අවසර දී ඇති පරිදි හැර, කිසියම් නිෂ්පාදකයෙකු, එකතු කරන්නකු, සකස් කරන්නකු හෝ වෙනත් යම් කිසිම පුද්ගලයකු විසින් කිරිවල හයිඩ්‍රජන් පෙරොක්සයිඩ් ($H_2O_2$) පාවිච්චි කිරීම, 1980 අංක 26 දරන ආහාර පනත හා එම පනත යටතේ පළ කරන ලද රෙගුලාසි යටතේ දඩුවම් ලැබිය හැකි වරදක් වන්නේය.

07 — 125